

# කස්තිරම

## ඩී බී කුරුප්පු

කැන්බරා පාර්ලිමේන්තුවට නුහුරු නුපුරුදු දර්ශනයක්. ඔස්ට්‍රේලියා ඉතිහාසයේ සන්ධිස්ථානයක්.. මුලු රටම උනන්දුවෙන් බලාපොරොත්තු වූ මොහොතක්.. මුලු ලොවම විමසුම් නෙත යොමු කරගෙන බලා සිටි පියවරක්..

මෙම මහාද්වීපයේ අග්‍රාමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුව තුළ මෙන්ම ඉන් පිටත දී කරන ලද අතිශය අනුවේදනීය කතාව එය යයි සිතමි. එය එකම එක වචනයකට සීමා වූ සංකේතයක් බව සැබැවි. කනගාටුව නොහොත් සමාව.. එහෙත් සමස්ත ඔස්ට්‍රේලියානු ජනතාවම - ජාතියම - බලපාන ආකාරයේ සංකේතයකි. ජාතියේ අනාගත ඉදිරි ගමන් මග සටහන් කරන ප්‍රබල සංකේතයකි.

කම්කරු අග්‍රාමාත්‍ය පෝල් කීටිං විසින් පත් කරන ලද කොමිසම විසින් 'පැහැරගත් පරපුර' යනවෙන් හඳුන්වනු ලබන - දෙමාපියන්ගෙන් උදුරාගෙන යනු ලැබූ ආදී වාසී දූ දරුවන් පිළිබඳ අතීතය විමර්ශනය කිරීමෙන් අනතුරුව 'ආපසු ඔවුන් ගෙදරට ගෙන ඒම' නමින් සකස් කරන ලද වාර්තාව පිළිගැනීමට කීටිං අගමැති පුටුවේ සිටියේ නැත. එය බාර දෙන ලද්දේ සන්ධාන රජයේ අග්‍රාමාත්‍ය ජෝන් හොවාඩ් අතට ය. 1997 වර්ෂයේ සිදුවූ එම පිළිගැන්වීම මෙල්බර්න්හි සම්මන්ත්‍රණ මධ්‍යස්ථානයේදී වූවකි. වාර්තාවේ මුල්ම නිර්දේශය වූයේ දරුවන් පැහැර ගෙන යාම වෙනුවෙන් රජය ඔවුන්ගෙන් සමාව යැදිය යුතු බව ය. - නැතහොත් කනගාටුව ප්‍රකාශ කළ යුතු බව ය. එම රැස්වීමේදීම බෙහෙවින් හැඟීම්බර කතාවක් පැවැත් වූ ජෝන් හොවාඩ් එම නිර්දේශය තරයේ ප්‍රතික්ෂේප කළේ ය. තමාගේ යුගයට අයත් නොවූ අය කළ දේට වගකීමට තමා හෝ තමාගේ රජය හෝ සූදානම් නැති බව කියා සිටියේ දැඩි අංග චලනයෙන් හා හැඟීම් ප්‍රකාශයකින් යුතු කතාවක් මගිනි. එම වාග් ප්‍රහාරයෙන් කුපිත වූ එහි සිටි ආදි වාසී ප්‍රේක්ෂකයන් කථිකයාට පසු පස හරවා ගෙන සිටි සැටි රූපවාහිනියෙන් එය නැරඹූවන්ට මතක ඇතැයි සිතමි. කලින් අගමැතිවරයාට බැරි යයි කී එම කාර්යය ලත් මුල් අවසරයෙන්ම ඉටු කරමින් අගමැති කෙවින් රඩ් කළ කතාව එබඳු හස්ත විකාර මුව විකාර කිසිවකින් තොර වූ - ඊට වඩා ශ්‍රාවකයන්ගේ හද කම්පා කරවන වූත් ගෞරවාන්විත අභිමානවත් ප්‍රකාශයක් විය.

පෙබරවාරි 12 සහ 13 යන දෙදින කැන්බරා පාර්ලිමේන්තු භූමියේ සිදු වූ ඓතිහාසික චාරිත්‍ර වාරිත්‍ර සහ අපේක්ෂා සහිත ප්‍රකාශ මෙන්ම ද්විපාක්ෂික ස්ථාවරය මෙම මහාද්වීපයේ ඉදිරි ගමන වඩා අර්ථවත් වූත් ඵලදායී වූත් මගකට යොමු කරන්නට සමත් වනු ඇත යන ප්‍රාර්ථනාව සමස්ත ඔස්ට්‍රේලියා ජනතාවගේම හදවත් තුළ අද රැඳී ඇතැයි සිතමි.

මේ රටේ අගනුවර සහ නව පාර්ලිමේන්තුව ඉදි කරන ලද කැන්බරා නම් ස්ථානය ඒ නමින් හැඳින්වෙනුයේ ආදිවාසීන්ගේ රැස්වීම් පලක් වශයෙන් පැවති නිසා ය. - එම අර්ථයෙනි. එහෙත් නව නගරයේ නව පාර්ලිමේන්තුව විවෘත කරන දිනයේ එය නරඹන්නට ආ තම භූමියේ පාරම්පරික උරුමක්කාරයකු වූ ගෝත්‍ර නායකයාට එහි රැඳී සිටින්නට අවසරයක් නොලැබිණ. ''උචිත ආකාරයට ඇඳ පැළඳ නොසිටි නිසා'' ඔහු එතැනින් පලවා හරිනු ලැබී ය. ඒ වැඩිහිටියාගෙන් පැවත එන මැටිල්ඩා හවුස් විලියම්ස් නමැති ආදිවාසී කාන්තාව විසින් පෙබරවාරි 12 වැනි දින නව පාර්ලිමේන්තුවේ සාමාජිකයන් චාරිත්‍රානුකූලව පිලිගනු ලැබීම මින් පෙර කිසි දිනක දක්නට නොලැබුණ දෙයකි. ඇය තමාගේ පරපුරේ නායකයකුට එදා මුහුණපාන්නට වූ දෙයද සිහිපත් කළා ය. ඇගේ කතාවේ වැදගත්ම අංගය වූයේ මේ රටේ හැම පෙදෙසකින්ම ආවුන් පමණක් නොව මිහිපිට හැම පෙදෙසකින්ම පැමිනෙන්නන් තමන්ගේ පාරම්පරික භූමිභාගයට සාදරයෙන් පිළිගන්නා බව අවධාරණය කිරීම ය.

ඇගේ එම ප්‍රකාශය හුදු පිළිගැනීමකට වැඩි දෙයක් වනුයේ පසු දින අගමැතිවරයා විසින් ඉදිරිපත් කරන ප්‍රකාශය නොහොත් ප්‍රතිඥාව අනුව අතීතය අමතක කර සමස්ත ඕස්ට්‍රේලියා ජනතාව සමග අතිනත් ගෙන ඉදිරියට යාමට ආදිවාසීන් තුළ පවත්නා අදිටනක් තහවුරු කරවන්නක් හෙයිනි.

විපක්ෂ නායක බ්‍රෙන්ඩන් නෙල්සන් එම පිළිගැනීමෙන් පසුව කළ ප්‍රකාශයක් මෙහි ලා බෙහෙවින් වැදගත් ය. අපගේ පාර්ලිමේන්තුව ආරම්භ කිරීම මින් පසු කලින් කළ පරිදි සිදු නොවන බවය ඒ. මැටිල්ඩා හවුස්ගේ පිළිගැනීමට කලින් පැවැත්වුණු ආදිවාසී චාරිත්‍ර විධි මින් ඉදිරියට හැම නව පාර්ලිමේන්තුවක් විවෘත කරන අවස්ථාවකම දක්නට ලැබීමට හොඳටම ඉඩ ඇති බව ඔහුගේ කතාවෙන් ඉඟි කෙරුණේ ය.

12 වැනි දින පැවැත්වුණු චාරිත්‍ර වාරිත්‍ර සහ දිවුරුම් දීම් වලින් පසු පාර්ලිමේන්තුවේ නිල කටයුතු පටන් ගත්තේ පසු දින - එනම් 13 වැනිදා ය. නව රජයේ පළමු නිල කාරිය වශයෙන් ආදිවාසී දූ දරුවන් මවුපියන්ගෙන් උදුරා ගෙන යාම පිලිබඳව - ඒ නිසා ඔවුන්ගේ දෙමාපියන්ට හා පවුල්වලට විඳින්නට සිදුවූ මානසික පීඩනය හා දුෂ්කරතාව පිලිබඳව රජයේ ශෝකය - කනගාටුව - ප්‍රකාශ කිරීම අතිශය වැදගත් ය. කෙවින් රඩ් අගමැතිවරයාගේ මෙම ප්‍රකාශයේ වැදගත් කම වැඩි වන්නේ එය ද්විපාක්ෂික ප්‍රකාශයක් ලෙසට ඉදිරිපත් කිරීමට ඔහු සමත් වීම ය. විපක්ෂ නායක බ්‍රෙන්ඩන් නෙල්සන් එය අනුමත කිරීම ය.

විපක්ෂ නායක ධුරය ලබා ගැනීමේදීත් ඉන් පසු කිහිප වතාවක් ජොන් හොවාඩ් ගේ මන්තරය ම මැතිරූ බ්‍රෙන්ඩන් නෙල්සන් අවසානයේ සිය ස්ථාවරය වෙනස් කිරීම ද ඓතිහාසික සිදුවීමකි. ආදිවාසී ප්‍රශ්නය - ආදිවාසී සංහිඳියාව -පක්ෂයකට නොහොත් රජයනට සීමා කළ නොහැකි සමස්ත ජනතාවටම පොදු සමස්ත ජනතාව විසින් විසඳාලිය යුතු ප්‍රශ්නයකි. ඉදිරියට කරන්නට යන ආදිවාසී දුෂ්කරතා විසඳීමේ කටයුතු මෙහෙයවා ලීම සඳහා තමාගේත් විපක්ෂ නායකයාගේත් මූලිකත්වයෙන් කමිටුවක් පත්කිරීමට යෝජනා කිරීමෙන් අගමැති වරයා විපක්ෂ නායකයාට කර අරින්නට බැරි තත්වයකට ඔහු පත් කළ බව පෙනෙයි. ඊටත් වඩා වැදගත් වනුයේ විපක්ෂ නායකයා කෙළින්ම එම පියවර අනුමත කිරීම ය.

විපක්ෂ නායකයාගේ කතාවට දැක්වූ ප්‍රතිචාරයේ 1997 හොවාර්ඩ් කතාවටද දක්වන ලද ප්‍රතිචාරයේම ලක්ෂණ තැනින් තැන මතු වුවත් බ්‍රෙන්ඩන් නෙල්සන් අගමැතිගේ ප්‍රකාශයම පුනරුච්චාරණය කිරීම ඓතිහාසික වැදගත්කමකින් යුතු වූවකි. සමස්ත ඔස්ට්‍රේලියාවටම බලපාන ප්‍රශ්නයක් විසඳීමේ දී එක් පක්ෂයක් එරෙහි වුවහොත් මතුවන බාධක අතිමහත් ය. රජයේ ප්‍රයත්නය අඩාල වීමට පමණක් නොව අසාර්ථක වන්නටද විපක්ෂයේ විරෝධය හේතු විය හැකිය. ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රශ්න විසඳීමේ දී හැම විටම සිරිතක් වශයෙන් රජයේ ප්‍රයත්නයට සහාය දෙනු වෙනුවට රජය බිඳ හෙළීමේ ව්‍යාපාරය දිගටම මෙහෙයවන විපක්ෂයක් දැක ඇති අපට මෙම ආදර්ශය අදහන්නට බැරි තරම් ය.

මෙම ඓතිහාසික අවස්ථාව සහ එදින සිදුවූ මහා ජාතික කාර්යය අප වැන්නන්ට වැදගත් වන්නේ ද? පිට රටකින් පැමිණ මෙහි වාසය කරන සුළු පිරිසක් වන ශ්‍රී ලාංකික ඕස්ට්‍රේලියානුවන් ඒ ගැන උදම් විය යුතු ද? උනන්දුවක් දැක්විය යුතු ද? එසේ නම් එයට හේතුව කුමක් ද?

ශ්‍රී ලාංකික ඕස්ට්‍රේලියානුවෝ ජනවාරි 26 වැනි දින පැවැත්වුණ ඕස්ට්‍රේලියා දින උත්සව වලට සහභාගි වන්නෝ ය. එසේ පෙරහැර කරන අපේ උදවිය අතුරින් කීයෙන් කී දෙනෙක් එම දිනයේ වැදගැම්ම සහ එම දිනයේ සිදු වූ දේ ගැන සිත යොමු කරද්ද? එම දිනය අද පවා සමහර ආදිවාසී ජන කොටස් විසින් 'ආක්‍රමණ දිනය' වශයෙන් සිහිපත් කරන බව අපි කල්පනා කරමු ද? එංගලන්තයෙන් මෙහි පැමිණ පදිංචි වන්නට පටන්ගත් පදිංචිකරුවන්ගේ මුල් පිරිස මෙහි ළඟා වූයේ 1788 දී ය.

'ප්‍රථම නාවුක හමුදාව' නමින් ඉතිහාසයේ සඳහන් වන කණ්ඩායම 1787 මැයි 13 වැනි දින සිය මව් බිමෙන් පිටත්ව ඔස්ට්‍රේලියාවට ළඟා වූයේ 1788 ජනවාරි 26 වැනි දින ය. සුදු පදිංචිකරුවන් පැමිණි දිනය වශයෙන් උත්සවාකාරයෙන් සිහිපත් කරනු ලබන එම දිනය 'ආක්‍රමණ දිනයක්' ලෙසින් අදත් සමහර ආදිවාසීන් සළකන්නේ යටත් පිරිසෙයින් පනස් දහස් වසරක් මෙම මහ පොළොව තම නිජ බිම ලෙසින් කිසිවකුගේ ඇඟිලි ගැසීමකින් තොරව පරිහරණය කළ ආදිවාෂීන්ට එතැන් සිට විඳින්නට වූ දුක් හිරිහැර නිසා ය.

එතැන් පටන් ආදිවාසීන්ට විඳින්නට සිදුවූ අතවර වලින් කියැවෙන කතාව එතරම් මිහිරි - හිතකර - වූවක් නොවේ. පුද්ගලික ඉඩම් හිමිකම පිලිබඳ සංකල්පයක් නොදත් ජනතාවක් වූ ආදිවාසීහු මහ පොළොව තමන්ට පොදුවේ අයත් වූවක් බව සැලකූහ. දඩයමෙන් ජීවත් වූ ඔවුහු එක්තැනක නොරැඳී ඔබ මොබ ගමන් කළහ. තමන්ගේ වාසයටත් වගාවට සහ සතුන් ඇති කිරීමටත් ඉඩම් ලබා ගැනීම පහසු කරනුවස් සුදු පදිංචිකරුවෝ 'ටෙරා නුලියස්' නමැති ලතින් පාඨය මගින් මෙය පහසු කර ගත් හ. එයින් අදහස් වනුයේ ජනාවාසයක් නොමැති බිම යනුවෙනි. මරේ දූපත්වාසී එඩී මාබෝ නමැති කළු මිනිසා විසින් ක්වීන්ස්ලන්ත රජයට එරෙහිව ඉදිරිපත් කරන ලද නඩුවක් අනුව ඔස්ට්‍රේලියානු මහාධිකරණය විසින් 1992 දී දෙන ලද ඓතිහාසික 'මාබෝ නඩු තීන්දුවෙන්' එම මතයේ සාවද්‍යතාව තහවුරු කරන තෙක් එම මතය පැවතිණ.


1993 දී 'මාබෝ පනත' නමින් හැඳින්වෙන ආදිවාසීන්ගේ ඉඩම් අයිතිය පිලිබඳ පනත සම්මත කිරීමෙන් පෝල් කීටින් ගේ කම්කරු රජය මෙම තත්තවය පිලිබඳ වෙනසක් ඇති කළේ විපක්ෂයේ දැඩි විරෝධය මධ්‍යයේ ය.

1967 ජනමත විචාරයකින් ආදිවාසීන් ඔස්ට්‍රේලියානු ජන සංගණනයට ඇතුළත් කිරීමට තීරණය කරන තෙක් ආදිවාසීහු තමන්ගේ නිජ බිමෙහිම පුරවැසි අයිතියක් නැති පිරිසක් වශයෙන් සළකනු ලැබූහ.

1970 දශනය වන තෙක්ම ආදිවාසීන්ගේ දරුවන් මව් පියන්ගෙන් බලයෙන් ම රැගෙන ගොස් මිෂනාරි ආයතන වල තබා ගන්නා ලදී . 'පැහැරගත් පරපුර' යනුවෙන් හැඳින්වෙන මෙම පිරිස පිලිබඳ වාර්තාව පිළි ගැනීමේදීය 1997 දී අගමැති ජෝන් හොවාර්ඩ් යට කී කතාව පැවැත්වූයේ.

එබඳු පසුබිමක් සහිත ලිබරල් - නැෂනල් සන්ධානයේ නායකයා මෙම කනගාටුව ප්‍රකාශ කිරීමට ද්විපාක්ෂික සහය දීම වැදගත් ය. ජාතිය වෙනුවෙන්ම දෙන ලද එම ප්‍රකාශය නොහොත් ප්‍රතිඥාව වූ කලී මෙරට මුල් පදිංචිකරුවන් වූ මෙම භූමියේ උරුමක්කාරයන් වූ ජනතාවගේ ජීවන තත්වය වැඩි දියුණු කිරීම දෙනු ලබන ප්‍රතිඥාවක් වන්නේ ය.

සුදු පදිංචි කරුවන් විසින් වැඩි දියුණු කරන ලද්දේ ආදිවාසීන්ගේ පාරම්පරික නිජභූමියේ පවත්නා සම්පත් ය. අද ආදිවාසීන්ටත් වඩා සැපවත් ජීවිතයක් ගත කරන්නේ ඔවුන්ගේ භූමියේ එම සම්පත නිසා ය. අනෙක් හැම ඕස්ට්‍රේලියානුවකු සේම අපිද ඔවුනට ණය ගැති විය යුත්තෙමු. ඔවුනගේ දියුනුවට ශුභ සිද්ධියට උර දී ක්‍රියා කළ යුත්තෙමු




**මෙම මහාද්වීපයේ අග්‍රාමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුව තුළ මෙන්ම ඉන් පිටත දී කරන ලද අතිශය අනුවේදනීය කතාව එය යයි සිතමි. එය එකම එක වචනයකට සීමා වූ සංකේතයක් බව සැබැවි. කනගාටුව නොහොත් සමාව.. එහෙත් සමස්ත ඔස්ට්‍රේලියානු ජනතාවම - ජාතියම - බලපාන ආකාරයේ සංකේතයකි. ජාතියේ අනාගත ඉදිරි ගමන් මග සටහන් කරන ප්‍රබල සංකේතයකි.**

තිසර FM 97.4
FM 97.4
සෙනසුරාදා පව 1 සිට 5 දක්වා
ඔබට පිදෙන සාර සංග්‍රහය